# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 61 දරන
# අත්‍යවශ්‍ය මහජන සේවා
# පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 8 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ඔක්තෝබර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිළ : ශත 65 යි　　　　තැපැල් ගාස්තුව : ශත 25 යි

# 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත

[සහතිකය සටහන් කළේ 1979 ඔක්තෝබර් මස 8 වන දින]

එල්. ඩී.—ඕ. 48/79.

**ඇතැම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ පළාත් පාලන ආයතන ද, සමූපකාර සමිති ද විසින් සලසනු ලබන සේවා අත්‍යවශ්‍ය මහජන සේවා ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1979 අංක 61 දරන අත්‍යවශ්‍ය මහජන සේවා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

ඇතැම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන හෝ සමූපකාර සමිති විසින් සලසනු ලබන සේවා අත්‍යවශ්‍ය මහජන සේවා ලෙස ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැකි බව.

2. (1) (අ) මේ පනතේ උපලේඛනයෙහි සඳහන් යම් සේවාවන් සැලසීමෙහි නිරතව සිටින්නා වූ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ සමූපකාර සමිතියක් හෝ වන යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක හෝ සමූපකාර සමිතියක හෝ එහි ශාඛාවක සේවයෙහි නියුක්ත තැනැත්තන්ගෙන් යම් වර්ගයක තැනැත්තන් විසින් සලසනු ලබන යම් සේවාවකට අවහිරයක් හෝ බාධාවක් හෝ සිදුවිය හැකි බව ; සහ

(ආ) එම වර්ගයේ තැනැත්තන් විසින් සලසනු ලබන සේවාව පවත්වා ගෙන යාම ජන ජීවිතයට අත්‍යවශ්‍ය බව

ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින්, අදාළ අමාත්‍යවරයා විමසා සහ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මඟින්, එම සේවාව අත්‍යවශ්‍ය මහජන සේවාවක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ උපලේඛනයෙහි සඳහන් යම් සේවාවන් සැලසීමෙහි නිරතව සිටින්නා වූ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ සමූපකාර සමිතියක් හෝ වන, යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක හෝ සමූපකාර සමිතියක හෝ එහි ශාඛාවක සේවයෙහි නියුක්ත තැනැත්තන්ගෙන් යම් වර්ගයක තැනැත්තන් විසින් සලසනු ලබන සේවාව අත්‍යවශ්‍ය මහජන සේවාවක් ලෙස ප්‍රකාශ කෙරෙන (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් බලාත්මක ව පවත්නා කාලය තුළ—

(අ) ඒ නියමයේ දිනයට ඉහතින් ම වූ දිනයේ දී එම සේවාවේ කාර්ය සඳහා එම දෙපාර්තමේන්තුවෙහි හෝ රාජ්‍ය සංස්ථාවෙහි හෝ පළාත් පාලන ආයතනයෙහි හෝ සමූපකාර සමිතියෙහි හෝ සේවයේ නියුක්තව සිටියා වූ හෝ එම දිනයෙන් පසු එම සේවයේ කාර්ය සඳහා එම දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව හෝ පළාත් පාලන ආයතනය

හෝ සමුපකාර සමිතිය හෝ විසින් සේවයේ නියුක්ත කරවනු ලබන හෝ යම් තැනැත්තකු, තම සේවා ස්ථානයට නැතහොත් එම දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ සමුපකාර සමිතියේ ප්‍රධානයා විසින් හෝ ඒ ප්‍රධානයාගේ අධිකාරය යටතේ ක්‍රියා කරන්නා වූ තැනැත්තකු විසින් කලින් කල නියම කරනු ලබන වෙනත් යම් ස්ථානයකට පැමිණීම පැහැර හරිනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ, එම දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ සමුපකාර සමිතියේ ප්‍රධානයා විසින් නැතහොත් ඒ ප්‍රධානයාගේ අධිකාරය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් ඉටු කළ යුතු යයි ඔහුට විධාන කරනු ලැබූ වැඩ ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ, ඒ වැඩ ඉටු කිරීම සඳහා යුක්ති සහගත ලෙස ප්‍රමාණවත් යයි එම දෙපාර්තමේන්තුවේ හෝ රාජ්‍ය සංස්ථාවේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ සමුපකාර සමිතියේ හෝ ප්‍රධානයා අදහස් කරන කාලයක් තුළ දී ඒ වැඩ ඉටු කිරීම පැහැර හරිනු ලැබුවහොත් හෝ ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ; හෝ

(ආ) යම් තැනැත්තකු, යම් ආකාරයකින්—

(i) එම සේවාව පවත්වාගෙන යාමට අවහිර කරන, බාධා කරන, එම සේවාව පවත්වාගෙනයාම ප්‍රමාද කරන හෝ සීමා කරන ; හෝ

(ii) එම සේවාවේ කාර්ය සඳහා එම දෙපාර්තමේන්තුවෙහි හෝ රාජ්‍ය සංස්ථාවෙහි හෝ පළාත් පාලන ආයතනයෙහි හෝ සමුපකාර සමිතියෙහි හෝ සේවයේ නියුක්ත ව සිටින්නා වූ වෙනත් යම් තැනැත්තකුට තම සේවා ස්ථානය වෙත පැමිණීමට අවහිර කරන, බාධා කරන හෝ එසේ පැමිණීම වළක්වන ; හෝ

(iii) එම සේවාවේ කාර්ය සඳහා එම දෙපාර්තමේන්තුවෙහි හෝ රාජ්‍ය සංස්ථාවෙහි හෝ පළාත් පාලන ආයතනයෙහි හෝ සමුපකාර සමිතියෙහි හෝ සේවයේ නියුක්ත ව සිටින්නා වූ වෙනත් යම් තැනැත්තකු තම සේවා ස්ථානය වෙත පැමිණීමෙන් වැළකී සිටීමට පොළඹවන, උනන්දු කරවන හෝ දිරිගන්වන ; හෝ

(iv) එම සේවාවේ කාර්ය සඳහා එම දෙපාර්තමේන්තුවෙහි හෝ රාජ්‍ය සංස්ථාවෙහි හෝ පළාත් පාලන ආයතනයෙහි හෝ සමුපකාර සමිතියෙහි හෝ සේවයේ නියුක්තව සිටින්නා වූ වෙනත් යම් තැනැත්තකුට තම සේවා ස්ථානයෙන් ඉවත්ව යාමට බල කරන, පොළඹවන, උනන්දු කරවන හෝ දිරිගන්වන ; හෝ

(v) එම සේවාවෙහි හෝ එම සේවාව පවත්වාගෙනයාම සම්බන්ධයෙන් හෝ සේවානියුක්තියක් භාර ගැනීමෙන් වෙනත් යම් තැනැත්තකු වළක්වන ; හෝ

(ඈ) මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් ක්‍රියාවක් සිදු කිරීමට, යම් තැනැත්තකු විසින්, යම් කායික ක්‍රියාවකින් හෝ යම් කථාවකින් හෝ ලියවිල්ලකින් හෝ වෙනත් යම් තැනැත්තකු පොළඹවන, උනන්දු කරවන හෝ දිරිගන්වන (එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ වෙනත් තැනැත්තා විසින් එසේ නිශ්චිතව සඳහන් යම් ක්‍රියාවක් කරනු ලැබුව ද නොලැබුව ද) අවස්ථාවක දී,

ඔහු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

3. (1) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ දී ක්‍රියාත්මක විය යුතු අතර, ඒ දිනයේ සිට මාස එකක කාලයක් ඒ නියමය කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබීමට හෝ ඒ කාලය අවසානයේ දී හෝ ඊට පෙර තවදුරටත් නියමයක් කරනු ලැබීමට හෝ හානියක් නොවන පරිදි මේ වගන්තියේ පහත දැක්වෙන විධිවිධානවලට යටත් ව, ක්‍රියාත්මකව පැවතිය යුතු ය. 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක වීම ආදිය.

(2) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට, ඒ නියමය නොප මාව ම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ නියමය ගැසට් පත්‍රයෙහි එසේ පළ කරන ලද දිනයේ සිට දින දහයක් තුළ දී අවසන් නොවන පරිදි වූ රැස්වීම් කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් හෝ නිසා පාර්ලිමේන්තුව විසංයුක්තව ඇති අවස්ථාවක දී ඒ නියමය පළ කරන ලද දින සිට දින දහයක් තුළ දී පාර්ලිමේන්තුව රැස්වීම සඳහා ප්‍රකාශනයක් නිකුත් කළ යුතු ය; තවද, ඒ අනුව ඒ ප්‍රකාශනය මගින් නියම කර ඇති දිනයේ දී පාර්ලිමේන්තුව රැස්ව කටයුතු කළ යුතු අතර, එකී දිනය දක්වා පාර්ලිමේන්තුව රැස්වීම් කල් තබා හෝ වාර අවසාන කොට හෝ තිබුණු කලක පරිද්දෙන් එදින සිට රැස් වී එහි කටයුතු කරගෙන යා යුතු ය.

(3) 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම නියමයක් ම ඒ නියමය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබ ඇත් නම් මිස, ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දින සිට දින දහහතරක කාලයක් ගතවීමෙන් පසු නිර්බල විය යුතු ය:

එසේ වුව ද, ඒ නියමය ගැසට් පත්‍රයෙහි පළ කරන ලද දිනයේ දී, (2) වන උපවගන්තියේ සඳහන් පරිදි එවැනි යම් රැස්වීම් කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් හෝ හේතු කොට ගෙන පාර්ලිමේන්තුව විසංයුක්තව තිබේ නම්, පාර්ලිමේන්තුව රැස්වී කටයුතු කරන රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබ ඇත් නම් මිස, පාර්ලිමේන්තුව රැස්ව කටයුතු කරන දිනයෙන් පසු දින දහයක කාලයක් අවසන් වූ විට ඒ නියමය නිර්බල විය යුතු ය.

4. (1) මේ පනත යටතේ වූ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ දී පැවැත්වෙන ලඝු නඩු විභාගය කින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකකට නොඅඩු වූ ද අවුරුදු පහක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දෙදහසකට නොඅඩු වැරදි.

වූ ද රුපියල් පන්දහසක් නොඉක්මවන්නා වූ ද දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ ඒ දඩය යන දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලබන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ ඒ අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අමතරව—

(අ) වරදකරු කරනු ලැබූ තැනැත්තා සතු සියලු චංචල හෝ නිශ්චල දේපළ, ජනරජය සන්තක විය යුතු බවට;

(ආ) යම් ලිඛිත නීතියක් යටතේ පවත්වා ගෙන යනු ලබන යම් ලේඛනයක යම් වෘත්තියක් හෝ රක්ෂාවක් කර ගෙන යාමට හිමිකම ඇති තැනැත්තකු ලෙස ඒ වරදකරු කරන ලද තැනැත්තා ලියාපදිංචිව සිටින යම් අවස්ථාවක, ඒ ලේඛනයෙන් එම තැනැත්තාගේ නම ඉවත් කරනු ලැබිය යුතු බවට

ආඥාවක් කිරීමට සෑහෙන හේතු ඇති බව අධිකරණයේ මතය වන අවස්ථාවක, ඒ අධිකරණය විසින් ඒ ආඥා දෙකින් එකක් හෝ ඒ ආඥා දෙකම හෝ කරනු ලැබිය හැකි ය.

(3) අධිකරණය විසින්, යම් තැනැත්තකු සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ආඥාවක් කරන ලද අවස්ථාවක, ඒ තැනැත්තකු විසින් සලසනු ලබන යම් සේවාවකට අදාළව 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් පළ කරන ලද දිනයෙන් පසු ඒ තැනැත්තා විසින් දේපළ සම්බන්ධයෙන් කරන ලද සෑම අන්සතු කිරීමක් ම හෝ බැහැර කිරීමක් ම ශූන්‍ය හා බල රහිත ව පැවති බවත් එසේ ශූන්‍ය හා බල රහිත වන බවත් සැලකිය යුතු ය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ කිරීම.

5. මේ පනත යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය අදාළ නොවිය යුතු ය.

වැඩ වර්ජනයක් කරගෙන යාමේ දී කරන ලද ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මේ පනත යටතේ වූ යම් අපරාධ නඩුවකදී නිදහසට කරුණක් නොවන බව.

6. මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව අපරාධ නඩුවක් පවරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ තැනැත්තා අයත් වෘත්තීය සමිතියක් විසින් ආරම්භ කරන ලද වැඩ වර්ජනයක් කර ගෙන යාමේ දී ඔහු විසින්, වරද සංයුක්ත වන ක්‍රියාව හෝ නොකර හැරීමක් කරන ලද බව ඔහු විසින් ඔප්පු කරනු ලැබීම නිදහසට කරුණක් නොවිය යුතු ය.

මේ පනත වෙනත් ලිඛිත නීති අභිබවා බල පැවැත්විය යුතු බව.

7. වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ එවැනි වෙනත් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටීමක් හෝ අනනුකූලතාවක් ඇති වන අවස්ථාවක දී, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

8. මේ පනතෙහි—

"සමුපකාර සමිතිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කර ඇතැයි සැලකෙන හෝ යම් සමිතියක් අදහස් වේ;

"ප්‍රධානයා" යන්නෙන්—

(අ) සමුපකාර සමිතියක් සම්බන්ධයෙන් වූ විට, ඒ සමුපකාර සමිතියේ සභාපතිවරයා අදහස් වේ;

(ආ) පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, එම පළාත් පාලන ආයතනයේ නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා හෝ එම පළාත් පාලන ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම පිණිස පත් කරන ලද විශේෂ කොමසාරිස්වරයා හෝ අදහස් වේ; තවද

(ඇ) රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වූ විට, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා අදහස් වන අතර, ඊට එම සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයා ද ඇතුලත් වේ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහ නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුලත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැත හොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලින් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ.

## උපලේඛනය

1. ආහාර හෝ පාන ද්‍රව්‍ය සැපයීම, ආරක්ෂා කිරීම සහ බෙදාහැරීම.
2. ඛනිජ තෙල් නිෂ්පාදන හා ගෑස් ඇතුළුව ඉන්ධන සැපයීම හෝ බෙදාහැරීම.
3. විදුලි බලය සැපයීම.
4. මගීන් හෝ බඩු ප්‍රවාහනය සඳහා වූ පොදු ගමනාගමන සේවා.
5. ජලය සැපයීම.
6. තැපැල්, දුරකථන, විදුලි පණිවිඩ සහ ගුවන් විදුලි සේවා.

7. (අ) (235 වන අධිකාරය වූ) තීරු බදු ආඥාපනතේ කාර්ය සඳහා අර්ථකථනය කරනු ලැබූ පරිදි වූ යම් වරායක් ඇතුළත වූ යාත්‍රාවලින් ආහාර හෝ පාන ද්‍රව්‍ය හෝ රට අඟුරු, තෙල් හෝ ඉන්ධන හෝ බෑම, ගෙනයාම, ගොඩබෑම, ගබඩා කිරීම, බාරදීම හා ඉවත් කිරීම;

(ආ) රෝහල්වල, සාත්තු නිවාසවල, බෙහෙත් ශාලාවල සහ සමාන වෙනත් ආයතනවල රෝගීන් නවත්තා කිරීම සහ භාර ගැනීම, බලා ගැනීම, පෝෂණය කිරීම සහ ප්‍රතිකාර කිරීම;

(ඇ) ජලය සැපයීම, විදුලි බලය, ජලාපවහනය සහ කසල කාණු ක්‍රමය, ගිනි නිවීමේ හා ගිලන් රථ සේවය. (අසූචි ගෙන යාම හා බැහැර කිරීම ඇතුළුව) කසල ශෝධනය සහ කුණු ඉවත් කිරීම සඳහා යම් පළාත් පාලන ආයතනයක් මඟින් කර ගෙන යනු ලබන යම් කාර්ය භාරයක්; සහ

(ඈ) මංමාවත්, පාලම්, බෝක්කු, ගුවන් තොටුපළවල්, වරායවල් සහ දුම්රිය මාර්ග ඇතුළුව, මංමාවත්, දුම්රිය මාර්ග හෝ ගුවන් මඟින් ගමනාගමන සේවා සඳහා පහසුකම් සැලසීම සහ පවත්වා ගෙන යාම

සම්බන්ධයෙන් අවශ්‍ය හෝ කළ යුතු යයි නියමිත කවර අන් දමේ හෝ විස්තරයක සියලු සේවා, වැඩ හෝ කාර්ය.

8. සියලු සමුපකාර සමිති හා සංගම් විසින් සලසනු ලබන සේවා.